# තංගල්ල නගර සභාව

# හම්බන්තොට දිස්ත්‍රික්කය

01. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අගෝස්තු 26 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 ජුනි 28 දිනද විගණනයට ඉදිරිපත කර තිබුණි.

1.2 මතය.

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව තංගල්ල නගර සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර 2010 දෙසැම්බර් 31 දිනට තංගල්ල නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක මුදල වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතු රු . 221,663 ක සඳහා ණයහමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල රු. 42,174 ක් වූ වියදම් සඳහා 2010 දෙසැම්බර් 31 දිනට ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට නිලධාරීන් 19 දෙනෙකුගෙන් වැටුප් රහිත නිවාඩු සඳහා අයකරගත යුතු මුදල රු. 141,571 ක් වුවද ණයගැතියන් යටතේ දක්වා තිබුණේ රු. 16,311 ක් පමණි.

(ඈ) 2009 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු ලෙස දැක්වෙන රු. 89,950 ක් වූ වීරී පහන් නඩත්තු මුදල් , සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබුණද එකී මුදල ණයගැතියන් යටතේ පෙන්වා තිබුණි.

(ඉ) 2008 වර්ෂය වෙනවෙන් ලැබිය යුතු වීරී පහන් නඩත්තු මුදල රු. 32,362 ක් වුවද එම මුදල රු. 54,940 ක් ලෙස රු. 22,578 ක් ණයගැතියන් යටතේ වැඩිපුර දක්වා තිබුණි .

(ඊ) 2010 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර ඇති තොග ලේඛන අනුව පොදු ගබඩා තොගය රු. 391,638 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන වල රු. 322,321 ක් ලෙස රු. 69,317 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සේවක ණය ලේඛනය අනුව 2010 දෙසැම්බර් 31 දිනට කලින් ලද සේවක ණය රු. 14,830 ක් වුවද එකී ශේෂය , ශේෂ පත්‍රයේ කලින් ලැබීම් ලෙස නොපෙන්වා ලැබිය යුතු මුළු සේවක ණය මුදලින් අඩුකර දක්වා තිබුණි. සේවක ණය කලින් ලැබීම් ශේෂයෙන් රු. 3,945 ක් පෙර වර්ෂයේ සිට කලින් ලැබීම් ලෙස සටහන්ව ඇති අතර, එකී ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) ගිණුම් අංක 06700175533192 කට අදාලව 2010 දෙසැම්බර් මස අයකර තිබූ රු. 3,750 ක් වූ බැංකු ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස දක්වා නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු. 48,400 ක ප්‍රාග්ධන වියදම් , අයභාර වියදම් ලෙස ගිණුම්ගත කොට තිබුණි.

1.3.2 <u>නොසැසඳු පාලන ගිණුම්.</u>

පාලන ගිණුම අනුව සේවක ඇප තැන්පත් ආයෝජන ශේෂය රු. 5,959 ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව වටිනාකම රු. 7,251 ක් වුයෙන් වෙනස රු. 1,292 ක් විය.

1.3.3 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්.

සමාලෝචිත වර්ෂයේ දෙන ලද රු. 54,133 ක් වූ අත්තිකාරම් මුදල් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 371 (2) නියමය ප්‍රකාර පියවා නොතිබුණි.

02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

2.1 මූල්‍ය ප්‍රතිඵලය.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු: 1,332,276 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු: 1,600,605 ක් විය.

2.2 මූල්‍ය පාලනය

(අ) එකතුව රු. 178,090 ක් වූ කල් ඉකුත් වූ චෙක්පත් 13 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ පවත්වා තිබූ සාරාංශ මුදල් පොත අනුව බැංකු ශේෂය අයිරා ගැන්වී තිබුණි.

2.3 ආදායම් පරිපාලනය.

2.3.1 ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තු ගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තු ගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 1,529 | 1,726 | 2,340 | 1,559 | 764 | 2,744 |
| බදුකුළී | 5,062 | 3,831 | 2,493 | 3,974 | 3,042 | 2,701 |
| බලපත්‍ර ගාස්තු | 582 | 582 | 122 | 587 | 413 | 269 |
| සේවා සඳහා ගාස්තු | 3,219 | 3,345 | 40 | 2,491 | 2,385 | 126 |
| වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | 322 | 291 | 32 | 271 | 264 | 17 |
| වෙනත් ආදායම් | 3,418 | 3,252 | 166 | 2,955 | 2,885 | 69 |

### 2.3.2 වරිපනම් බදු

නගර සභා ආඥා පනතේ 170 (1) හා (2) වගන්ති ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානය වන විට සභාවට අයවිය යුතු රු. 2,379,171 ක් වූ හිඟ වරිපනම් බදු මුදල් අයකර ගෙන නොතිබුණි

### 2.4 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයට අදාල සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 අයවැයගත | 2010 තථ්‍ය | 2010 විචලනය | 2009 අයවැයගත | 2009 තථ්‍ය | 2009 විචලනය |
|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| පෞද්ගලික පඩිනඩි | 43,585 | 23,255 | 20,330 | 40,554 | 23,058 | 17,496 |
| අනෙකුත් | 12,550 | 11,585 | 965 | 9,875 | 9,347 | 528 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| උප එකතුව | 56,135 | 34,840 | 21,295 | 50,429 | 32,405 | 18,024 |
| ප්‍රාග්ධන වියදම් | 51,939 | 54,175 | (2,236) | 896 | 23,416 | (22,520) |
| මුළු එකතුව | 108,074 | 89,015 | 19,059 | 51,325 | 55,821 | (4,496) |

ඉහත තොරතුරු අනුව 2010 අයවැයගත පුනරාවර්තන වියදමේ රු. 21,295,000 ක ඉතිරියක් දක්නට ලැබුණු අතර, ප්‍රාග්ධන වියදම් සඳහා පසුව අනුමත වු රු. 50,547,000 ක පරිපූරක ඇස්තමේන්තුව සමඟ අයවැයගත මුළු ප්‍රාග්ධන වියදම ඉක්මවා රු. 2,336,000 ක් වැයකර තිබුණි.

2.5 මානව සම්පත් කළමණාකරණය

2.5.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 02 | 01 |
| ද්විතියික | 66 | 50 |
| තෘතියික | 52 | 38 |
| වෙනත් (අනියම්,තාවකාලික) | - | 33 |

(ආ) 2006 අප්‍රේල් 10 , 2006 මැයි 10 හා 2006 අගෝස්තු 01 දිනැති කළමනාකරණ සේවා අංක 28, 28 (i) , 28 (ii) චක්‍රලේඛ අනුව විධිමත් අනුමැතියක් නොමැතිව සභාව විසින් අනියම් හා තාවකාලික සේවකයින් 33 දෙනෙකු බඳවාගෙන සේවයේ යොදවා වැටුප් ගෙවා තිබුණි.

2.6 වත්කම් කළමණාකරණය.

2.6.1 ලැබිය යුතු ගිණුම්.

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 26,124,917 ක් වු අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ගිණුම් ශේෂවල එකතුව රු. 2,542,407 ක් විය.

2.6.2 අයවීමට ඇති සේවක ණය.

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂ වල එකතුව රු. 2,077,270 ක් වූ අතර , සේවය හැර ගොස් තිබූ සේවකයින්ගෙන් වසර ගණනාවක සිට අයවීම අත්හිට වී තිබූ ශේෂය රු. 47,375 ක් විය.

2.7 හඳුනාගත් පාඩු

2009 අප්‍රේල් සහ මැයි මාසවලට අදාල සේවක අර්ථ සාධක අරමුදල් දායක මුදල් ගෙවීම ප්‍රමාද කිරීම නිසා රු. 5,109 ක අධිභාර 2010 ජූනි මාසයේදී ගෙවා තිබුණි.

2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

(අ) තංගල්ල ජනතා පොළ

❖ දකුණු පළාත් ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතය මගින් රු. 29,355,572 ක් වැයකර ඉදිකරන ලද තංගල්ල ජනතා පොළ 2008 වර්ෂයේදී සභාවට පවරා දී වසර දෙකකට වැඩි කාලයක් අවසන්ව තිබුණද එම පොළ මහජනතාව සඳහා විවෘත කර නොතිබුණි.

❖ එකී පොළ භූමිය තුළ සභාව මගින් ඉදිකරන ලද කඩකාමර 10 ක් ඇතුළු කඩ කාමර 25 ක් බදුදීමකින් තොරව වසර දෙකකට වඩා වැඩි කාලයක් වසා තැබීම නිසා සභාවට ලබාගත හැකිව තිබූ ආදායමක් අහිමි වී තිබුණි.

❖ එම ගොඩනැගිලි වල ආරක්ෂාව සඳහා පත්කරන ලද මුරකරුට 2010 ජනවාරි මාසයේ සිට 2010 වර්ෂයේ අගෝස්තු දක්වා වැටුප් ලෙස රු. 122,544 ක් ගෙවා තිබුණි.

(ආ) වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම.

1988 අංක 74 දරණ පනතින් සංශෝධිත 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත හා ඒ සම්බන්ධයෙන් වූ 1994 පෙබරවාරි 18 දිනැති අංක 04/1994 දරණ අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය පරිදි වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබාගත යුතු වුවත් 2010 වර්ෂය සඳහා මන්ත්‍රීවරු 09 ක් අතුරින් මන්ත්‍රීවරු 05 දෙනෙක් ඉහත ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) <u>මහජන පුස්තකාලය.</u>

(i) පුස්තකාලයෙන් 2009 හා 2010 වසරවල නිකුත් කරනු ලැබූ රු. 5,710 ක් වටිනා පොත් ආපසු භාර නොදීම නිසා සිදුවී ඇති පාඩුව පාඨකයන්ගෙන් හෝ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2009 දෙසැම්බර් 31 දිනට පුස්තකාලයේ භාණ්ඩ සමීක්ෂණය තුලින් හඳුනාගත් පොත් ඌණතාවයේ අගය වූ රු. 2,457 ක් අදාල නිලධාරින්ගෙන් විගණිත දිනය වූ 2011 සැප්තැම්බර් 12 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඈ) <u>සභාපතිවරයාගේ ජපාන සංචාරය .</u>

ජපානයේ නාගසාකි නුවර 2009 අගෝස්තු 06 සිට 10 වෙනිදා දක්වා පවත්වා තිබූ සාමය සඳහා වන නගරාධිපති සම්මේලනයේ 7 වන මහා සමුළුවට සභාපතිවරයාගේ සහභාගි වීම වෙනුවෙන් රු. 192,200 ක මුදලක් වැයකර තිබුණි. සම්මේලනයට සහභාගීවීම සඳහා 2009 අගෝස්තු 03 දිනැති ලිපියෙන් ලැබී තිබූ ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය 2009 අගෝස්තු 06 දිනැති ලිපියෙන් අවලංගු කර තිබුණි. සම්මේලනයට සහභාගී වීම සඳහා සභා අරමුදලින් වැයකරන ලද සම්පූර්ණ මුදලම නැවත සභා අරමුදලට බැරකරන ලෙස 2009 අගෝස්තු 25 දනැති ලිපියෙන් ආණ්ඩුකාරතුමිය විසින් සභාපතිවරයාට දන්වා තිබුණද විගණිත දිනය වූ 2011 සැප්තැම්බර් 12 දින වන විටත් සභාපතිවරයා විසින් එම මුදල සභා අරමුදලට බැරකර නොතිබුණි.

2.9 <u>පොත්පත් හා ලේඛන පැවැත්වීම</u>.

සභාව විසින් පවත්වාගෙන යායුතුව තිබූ ලේඛන 06 ක් විධිමත්ව හා යාවත්කාලිනව පවත්වා නොතිබුණි.

2.10 <u>අභ්‍යන්තර විගණනය.</u>

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

03. පද්ධති හා පාලන.

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඇ) ගබඩා පාලනය